කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

ලංසු සඳහා ආරාධනයයි

මණ්ඩලයෙන් ඉවත් කරන ලද යන්ත්‍ර සූත්‍ර අපහරණය කිරීම

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) වෙනුවෙන් සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (කුඩා) විසින්, මණ්ඩලයෙන් ඉවත් කරන ලද යන්ත්‍ර සූත්‍ර අපහරණය කිරීම සඳහා මුද්‍රා තැබූ මිල ගණන්පත් කැඳවනු ලැබේ.

ලංසු අංක	:	T/05/2026
ලංසු නාමය	:	මණ්ඩලයෙන් ඉවත් කරන ලද යන්ත්‍ර සූත්‍ර අපහරණය කිරීම සඳහා ලංසු කැඳවීම.
ලංසු ලේඛන ගාස්තුව	:	රු. 2,000.00 (ආපසු නොගෙවන)
ලංසු තැබීමේ අවසන් කාලය	:	2026/11/18 පෙ.ව. 11.30 ට
ලංසු ආරක්ෂණ මුදල	:	ලංසු වටිනාකමින් 01% කට වැඩි මුදලක් (ලංසු ආරක්ෂණ මුදල IDB ප්‍රධාන කාර්යාලය වෙත ගෙවීම් කළ යුතුය)
ලේඛන නිකුත් කරන ස්ථානය	:	සැපයුම් අංශය – IDB ප්‍රධාන කාර්යාලය
ලංසු ලේඛන නිකුත් කරනු ලබන කාලසීමාව	:	2026/11/02 – 2026/11/17 පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා

01. අපහරණය කිරීමට නියමිත මෙම අයිතමයන් 2026/11/02 දින සිට 2026/11/17 දින දක්වා කාර්යාලයීය දිනයන්හිදී පෙ.ව. 09.00 සිට. ප.ව. 03.00 දක්වා පහත ලිපිනයන්හිදී පරීක්ෂා කර බැලිය හැකි අතර මේ සඳහා ඕනෑම අයෙකුට මිල ගණන් ඉදිරිපත් කළ හැකිය. අනත්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ තහවුරු කළ හැකි වෙනත් ලේඛන ඉදිරිපත් කළ යුතුය.

	මධ්‍යස්ථානය	විමසීම්	ලිපිනය	දුරකථන අංකය
i	ප්‍රධාන කාර්යාලයේ, මුද්‍රණ ඒකකය	නියෝජ්‍ය අධ්‍යක්ෂ	ව්‍යවසායකත්ව සංවර්ධන අංශය, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, නො. 615, ගාලු පාර, කටුබැද්ද, මොරටුව.	011-2605326/7 දිගුව - 152, 338
ii	යෝ.තා.පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථාන (ATRDC) - පත්තල	තේවාසික අධ්‍යක්ෂ	යෝ.තා.ප. හා සං. මධ්‍යස්ථාන, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, පත්තල.	037-2246029
iii	පැලියගොඩ විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථාන (EPC) - පැලියගොඩ	සහකාර අධ්‍යක්ෂ	විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, නො. 33, නව නුගේපාර, පැලියගොඩ.	011-2930736
iv	රබර් භාණ්ඩ සංවර්ධන හා සේවා මධ්‍යස්ථාන (RPD&SC) - පැලියගොඩ	සහකාර අධ්‍යක්ෂ	ර.භා.සං.හා සේවා මධ්‍යස්ථානය, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, නො. 33, නව නුගේපාර, පැලියගොඩ.	011-2942364

02. මේ සඳහා උනන්දුවක් දක්වන හා සුදුසුකම්ලත් ලංසුකරුවන්ට, මොරටුව, කටුබැද්ද, ගාලු පාරේ අංක 615 දරන ස්ථානයේ පිහිටි ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ (Industrial Development Board of Ceylon - IDB) සැපයුම් අංශයේ, සහකාර අධ්‍යක්ෂ (සැපයුම්) වෙතින් වැඩිදුර තොරතුරු ලබා ගත හැකි අතර, 2026/11/02 සිට 2026/11/17 දක්වා රජයේ කාර්යාල දිනවල උදැසන 09:00 සිට පස්වරු 03:00 දක්වා කාලය තුළ ලංසු ලේඛන පරීක්ෂා කළ හැක. තවද, මෙම ලංසු ලේඛන IDB ආයතනයේ වෙබ් අඩවියෙන් (www.idb.gov.lk) සහ කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් (www.industry.gov.lk) ද (පරීක්ෂා කිරීමේ අරමුණින් පමණක්) දැක බලා ගත හැකිය.

එහෙත්, ලංසු ඉදිරිපත් කිරීමේදී, ඉහත සඳහන් කාර්යාලයෙන් මිලදී ගන්නා ලද ලංසු ලේඛනයන් පමණක් අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය. වැඩි විස්තර සඳහා 011-2607004 (සහකාර අධ්‍යක්ෂ – සැපයුම්), හෝ 011-2605326, 7 (දිගුව 148 – සැපයුම් අංශය) ඔස්සේ සම්බන්ධ විය හැක.

03. සිංහල භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මොරටුව, කටුබැද්දේ පිහිටි IDB ප්‍රධාන කාර්යාලයේ සැපයුම් අංශයේ සහකාර අධ්‍යක්ෂ වෙතින්, 2026/11/02 සිට 2026/11/17 දක්වා (රජයේ කාර්යාල දිනවල) උදැසන 09:00 සිට පස්වරු 03:00 දක්වා කාලය තුළ ලබා ගත හැක.

3.1 ලංසුකරුවෙකු ලංසු ලේඛන මිලදී ගැනීමට පැමිණෙන විට, ව්‍යාපාරික හෝ පුද්ගලික නම, ව්‍යාපාර ලියාපදිංචි අංකය හෝ පුද්ගලික ජාතික හැඳුනුම්පත් අංකය, ලංසු අංකය සහ ලංසුවේ නම ඇතුළත් කර, **"සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (කුඩා)"** වෙත යොමු කරන ලද ඉල්ලීම් ලිපියක් (Request Letter) ඉදිරිපත් කළ යුතුය.

සහ

3.2 ලංසු ලේඛන ලබා ගැනීමට පෙර, ඉහත සඳහන් ආපසු නොගෙවන ලංසු ලේඛන ගාස්තුව ගෙවිය යුතුය. මෙම ගෙවීම් සිදු කළ යුත්තේ මුදලින් (Cash) පමණි.

04. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන, කටුබැද්දේ පිහිටි ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ (IDB) ප්‍රධාන කාර්යාලයේ, සභාපති කාර්යාලය ඉදිරිපිට ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය. එසේ නොමැති නම්, ඉහත සඳහන් කර ඇති වේලාවට හෝ ඊට පෙර, **"සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (කුඩා), ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, අංක 615, ගාලු පාර,කටුබැද්ද, මොරටුව"** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ කුරියර් සේවාවක් මගින් යොමු කළ යුතුය. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම, සහභාගිවීමට කැමති ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී IDB ප්‍රධාන කාර්යාලයේ පිහිටි සැපයුම් අංශයේදීලංසු විවෘත කරනු ලැබේ.ලංසුව අඩංගු කවරයේ ඉහළ වම් කෙළවරේ "ලංසු අංකය" සහ "ලංසු නාමය" සඳහන් කළ යුතුය. නියමිත වේලාවට පසුව ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සභාපති
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (කුඩා)
ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
අංක 615, ගාලු පාර, කටුබැද්ද, මොරටුව.
දුරකථන/ෆැක්ස් – 011-2607004